// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2113/15 – 2019 මාර්තු 05 වැනි අඟහරුවාදා – 2019.03.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/සීඔඑම්/02/ආර්/2014/102.

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්ගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

ලංකා වතු සේවා සංගමය, අංක 06, ඇලෝයි මාවත, කොළඹ 03. (එම්. එස්. එස්.සොයිසා මයා සහ කේ. ඒ. ඒ. නිශාන්ත මයා වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

හලාවත වැවිලි සමාගම, ''කප්රුක සෙවණ'', අංක 165, පුත්තලම් පාර, හලාවත.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ

ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බොරලැස්ගමුව, පිරිවෙන පාර, අංක 128, එස්. විරිතමුල්ල මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/R/2014/102.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

ලංකා වතු සේවා සංගමය, අංක 06, ඇලෝයි මාවත, කොළඹ 03. (එම්. එස්. එස්.සොයිසා මයා සහ කේ. ඒ. ඒ. නිශාන්ත මයා වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

හලාවත වැවිලි සමාගම, ''කප්රුක සෙවණ'', අංක 165, පුත්තලම් පාර, හලාවත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''හලාවත වැවිලි සමාගමේ සේවය කරන ස්ථාන භාර නිලධාරීන් වන එම්. එස්. එස්. සොයිසා මහතා සහ කේ. ඒ. ඒ. නිශාන්ත මහතා හට 2014 වර්ෂයේ ලබා නොගත් අසනීප නිවාඩු සඳහා වන දීමනා නොගෙවීමෙන් අසාධාරණයක් සිදුවී ඇත් ද යන්න හා එලෙස අසාධාරණයක් සිදුවී ඇත්නම් ඔවුන් එකිනෙකාට හිමි සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.''.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 පෙබරවාරි මස 06 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

03 - 921

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.